AL/2024/29/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I
தொடர்பாடலும் ஊடகக் கற்கையும் I
Communication and Media Studies I

29 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** සන්නිවේදන ක්‍රියාවලිය මූලික වශයෙන් සමන්විත වන්නේ,
(1) අදහස්වලිනි. (2) සිදුවීම්වලිනි. (3) සංකේතවලිනි.
(4) තොරතුරුවලිනි. (5) පුද්ගලයන්ගෙනි.

**2.** සන්නිවේදකයාගේ අදහස් සහ හැඟීම් සංදේශ බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය,
(1) පරිකල්පනයයි. (2) විකේතකරණයයි. (3) භාෂණයයි.
(4) ආකේතකරණයයි. (5) සංජානනයයි.

**3.** තිර පිටපත් රචකයෙකු තම අත්දැකීම් ඇසුරෙන් සිදු කරන නිර්මාණයක දී දක්නට ලැබෙන සන්නිවේදන වර්ගය කුමක් ද?
(1) නිර්මාණාත්මක (2) අන්තර්පුද්ගල (3) ලිඛිත
(4) අවිධිමත් (5) අන්තර්වර්තී පුද්ගල

**4.** සන්නිවේදනය හා එය සිදුවන වටපිටාව අතර පවත්නා සම්බන්ධය යනුවෙන් අදහස් කරන්නේ,
(1) අරමුණු සහගත වීම ය.
(2) සංකේතාත්මක වීම ය.
(3) විවිධාකාර වීම ය.
(4) සන්දර්භානුගත වීම ය.
(5) ඒකමාර්ගික හා ද්විමාර්ගික වීම ය.

**5.** දුරකථනය හා ටෙලිග්‍රාෆ් තාක්ෂණය වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස බිහිවූයේ කුමක් ද?
(1) පුවත්පත (2) සඟරාව
(3) විද්‍යුත් පුවත්පත (4) රූපවාහිනිය
(5) ගුවන්විදුලිය

**6.** අන්තර් ක්‍රියාකාරී සන්නිවේදනයක යෙදීම වඩාත් පහසු වන්නේ,
(1) අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී ය.
(2) සමූහ සන්නිවේදනයේ දී ය.
(3) අතථ්‍ය සන්නිවේදනයේ දී ය.
(4) යන්ත්‍ර-සහායක අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී ය.
(5) යන්ත්‍ර-සහායක සමූහ සන්නිවේදනයේ දී ය.

**7.** ෆෙඩරල් සන්නිවේදන කොමිසම යනු
(1) අමෙරිකානු මාධ්‍ය නියාමන ආයතනයකි.
(2) බ්‍රිතාන්‍ය ගුවන්විදුලි නියාමන ආයතනයකි.
(3) මහජන සේවා දිරිගන්වන ගෝලීය ආයතනයකි.
(4) ගුවන්විදුලි තරංග නියාමන අධිකාරියකි.
(5) සමාජ මාධ්‍ය නියාමන ආයතනයකි.

[ දෙවැනි පිටුව බලන්න

**8.** ගුවන්විදුලි මාධ්‍ය වැඩසටහනක දී වැඩිම අවධානය යොමුවන පාර්ශ්වය වන්නේ,
(1) සන්නිවේදකයා ය. (2) හිමිකරුවා ය. (3) අනුග්‍රාහකයා ය.
(4) ග්‍රාහකයා ය. (5) වාර්තාකරුවා ය.

**9.** එදිනෙදා ජීවිතයට අවශ්‍ය තොරතුරු ඇතුළත් කරමින් නිශ්චිත කාලවකවානුවක දී එකට බැඳ අඛණ්ඩව ප්‍රකාශයට පත් කරනු ලබන්නේ,
(1) පුවත්පත් ය.
(2) පොත් ය.
(3) ආගමික පත්‍රිකා ය.
(4) සඟරා ය.
(5) අත් පත්‍රිකා ය.

**10.** ජනමාධ්‍ය තොරතුරුවල දැකිය හැකි වඩාත් කැපීපෙනෙන ගුණාංගය වන්නේ,
(1) විවිධත්වයයි. (2) සංකීර්ණත්වයයි. (3) දෛනිකත්වයයි.
(4) ආකර්ශණීයත්වයයි. (5) විශ්වසනීයත්වයයි.

**11.** තොරතුරු ගබඩා කර සංරක්ෂණය කිරීම සඳහා පදනම සකස් වන්නේ,
(1) භාෂාවේ සම්භවයත් සමග ය.
(2) ලේඛනයේ ආරම්භයත් සමග ය.
(3) ජනමාධ්‍යවල ආරම්භයත් සමග ය.
(4) මුද්‍රණ තාක්ෂණයේ දියුණුවත් සමග ය.
(5) ඩිජිටල් දත්ත සංචිතකරණයේ ආගමනයත් සමග ය.

**12.** ජනමාධ්‍ය මගින් ඉදිරිපත් වන තොරතුරු පිළිබඳ තීරණ ගනු ලබන්නේ,
(1) මාධ්‍ය හිමිකරුවන් ය. (2) දැන්වීම්කරුවන් ය. (3) සංස්කාරකවරුන් ය.
(4) දොරටුපාලකයන් ය. (5) නිසි බලධාරීන් ය.

**13.** මහජන සම්බන්ධතා යනු යහපත් සිතින් යුතුව මානව සදාචාර සම්පන්න භාවය ඇති කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග බව සඳහන් කළේ කවුරුන් ද/කවර ආයතනය ද?
(1) එඩ්වඩ් එල්. බර්නීස්
(2) චාර්ල්ස් ප්ලැකාඩ්
(3) සැම් බ්ලැක්
(4) ජෝශප් ආර්. ඩොමිනික්
(5) බ්‍රිතාන්‍ය මහජන සම්බන්ධතා පිළිබඳ වරලත් ආයතනය

**14.** පහත අදහස් සලකන්න.
*A* - ග්‍රාහකයාට අනුව වචන තෝරා ගත හැකි ය
*B* - අවධානයෙන් සවන් දීම සිදු කළ හැකි ය
*C* - නිර්වාචික සන්නිවේදනය භාවිත කළ හැකි ය
*D* - නිශ්චිත ධූරාවලියක් දැකගත හැකි ය
ඉහත අදහස් අතුරෙන් ඵලදායී කථන සන්නිවේදනයට වඩාත් අදාළ වන්නේ මින් කවරක් ද?
(1) *A* හා *B* (2) *A* හා *C* (3) *B* හා *C*
(4) *B* හා *D* (5) *C* හා *D*

**15.** මාධ්‍ය සාක්ෂරතාවට අදාළ ඥාන ව්‍යුහ ගොඩනැගෙන්නේ,
(1) පලපුරුද්දෙනි.
(2) අවිඥානිකව ය.
(3) පුද්ගලයාගේ අරමුණු ඇසුරෙනි.
(4) සමාජ අන්තර් ක්‍රියාකාරීත්වයෙනි.
(5) තෝරාගත් තොරතුරු සමූහයක් ඇසුරෙනි.

**16.** භවභෝග ආරක්ෂා කර ගැනීම, අපල උපද්‍රව වලින් වැළැකීම හා විනෝදාස්වාදය ලබාදීම වැනි කරුණු අරමුණු කර ගත් සාම්ප්‍රදායික මාධ්‍ය විධික්‍රමයක් වන්නේ,
(1) ජන කවියයි. (2) ජන කතාවයි. (3) කෝලම් නාට්‍යයයි.
(4) යාතුකර්මයි. (5) සොකරි නාට්‍යයයි.

**17.** වර්තමානයේ දී යමෙකුට අන්තර්ජාලය මගින් පුවත්පත් කියවීමට, ගුවන්විදුලිය ශ්‍රවණය කිරීමට මෙන් ම රූපවාහිනිය හා චිත්‍රපට නැරඹීමට අවස්ථාව හිමි වී තිබේ. මෙම තත්ත්වය හඳුන්වන සංකල්පය වන්නේ,

(1) නිර්මහාපරිමාණකරණයයි. (2) මාධ්‍ය අභිසාරිතාවයි. (3) නිර්නියාමනයයි.
(4) ගෝලීයකරණයයි. (5) මාධ්‍ය නියාමනයයි.

**18.** 'Many Voices, One World' වාර්තාව ඉදිරිපත් කරන ලද්දේ,
(1) එක්සත් ජාතීන්ගේ සංවිධානයෙනි.
(2) නොබැඳි සමුළුවෙනි.
(3) යුනෙස්කෝ සංවිධානයෙනි.
(4) පොදු රාජ්‍ය මණ්ඩලයෙනි.
(5) යුරෝපා සංගමයෙනි.

**19.** මාධ්‍ය සාක්ෂරතාව යනු බහු මාන සහිත සංකල්පයකි. ඊට අයත් ප්‍රධාන මාන වන්නේ,
(1) සංජානන, චිත්තවේගී, සෞන්දර්යාත්මක හා සදාචාර මානයි.
(2) චිත්තවේගී, සෞන්දර්යාත්මක, සදාචාර හා දේශපාලනික මානයි.
(3) සෞන්දර්යාත්මක, සදාචාර, පෞද්ගලික හා අන්තර් ක්‍රියාකාරී මානයි.
(4) සදාචාර, පෞද්ගලික, දේශපාලනික හා චිත්තවේගී මානයි.
(5) පෞද්ගලික, අන්තර් ක්‍රියාකාරී, චිත්තවේගී හා සංජානන මානයි.

**20.** මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය,
(1) ගිවිසුමක ස්වභාවය පෙන්නුම් කරන අතර ඍජු නෛතික බැඳීමකින් යුක්ත වූවකි.
(2) භාෂණයේ හා ප්‍රකාශනයේ හිමිකම පාදක කර ගත් ලියවිල්ලකි.
(3) එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් රටවල පුරවැසියන්ට අදාළ වූවකි.
(4) පළමු ලෝක යුද්ධයේ අත්දැකීම්වල ප්‍රතිඵලයක් ලෙස ප්‍රකාශයට පත් වූවකි.
(5) බොහෝ රටවල මූලික අයිතිවාසිකම් සඳහා පදනම සකස් කරන ලද්දකි.

**21.** නව මාධ්‍ය හා සමාජ මාධ්‍යට විශේෂිත කාර්යයන් වන්නේ,
(1) තොරතුරු හා විනෝදාස්වාද සම්පාදනයයි.
(2) සමාජානුයෝජනය හා අධ්‍යාපනයයි.
(3) විකල්ප මණ්ඩප මෙන්ම සම්බන්ධතා ගොඩනැගීමයි.
(4) සුපරීක්ෂණය හා අර්ථකථනයයි.
(5) ආරක්ෂකයකු හා ගුරුවරයකුගේ භූමිකාවයි.

**22.** සිනමාව සමග සැසඳීමේ දී රූපවාහිනියට විශේෂිත ලක්ෂණයක් වන්නේ, එය
(1) සාමූහික නිර්මාණ කාර්ය සහිත වීම ය.
(2) තිර රචනා උපයෝගී කර ගැනීම ය.
(3) කලාත්මක මාධ්‍යයක් වීම ය.
(4) පොදු මාධ්‍යයක් වීම ය.
(5) දෘශ්‍ය සාක්ෂරතාව උපයෝගී කර ගැනීම ය.


**23.** සමකාලීන ජනප්‍රිය සංස්කෘතිය තුළ රූපවාහිනී මාධ්‍යය වඩාත් අවධානය යොමු කරන ලක්ෂණය වන්නේ,
(1) අධ්‍යාපනයේ වටිනාකමයි.
(2) මානවවාදයට ගරු කිරීමයි.
(3) අල්පේච්ඡතාවෙහි වටිනාකමයි.
(4) සෞන්දර්යාංගයන්හි වැදගත්කමයි.
(5) පරිභෝජනයේ ආකර්ෂණයයි.

**24.** මාධ්‍ය විසින් මවනු ලබන මායාව හා යථාර්ථය හඳුනා ගැනීමට අවශ්‍ය ඥානය ගොඩනැගෙන්නේ,
(1) මාධ්‍ය අධ්‍යාපනයෙනි.
(2) මාධ්‍ය සාක්ෂරතාවෙනි.
(3) මාධ්‍ය විචාරයෙනි.
(4) මාධ්‍ය විශ්ලේෂණයෙනි.
(5) මාධ්‍ය පිළිබඳ අවධානයෙනි.

[ හතරවැනි පිටුව බලන්න

**25.** "අපේ කාලේ නම් ඔය එක එක ජනමාධ්‍යයන්ගෙන් කියන ඒවට වඩා අපි දැනුම ලබා ගත්තේ අපේ මුතුන් මිත්තන්ගෙන්" යැයි සීයා කීවේ ය. ඔහු සඳහන් කරන්නේ,
(1) ජන විශ්වාස පිළිබඳවයි.
(2) ජනප්‍රවාද පිළිබඳවයි.
(3) ජනශ්‍රැති පිළිබඳවයි.
(4) පුරාණෝක්ති පිළිබඳවයි.
(5) ජනකතා පිළිබඳවයි.

● **26** සිට **29** දක්වා ප්‍රශ්න සඳහා පහත සන්නිවේදන ආකෘතිය උපයෝගී කර ගන්න.




**26.** ඉහත සන්නිවේදන ආකෘතිය පිළිබඳ **සදොස්** ප්‍රකාශය තෝරන්න.
(1) එය බටහිර සන්නිවේදන ආකෘතියකි.
(2) එය ජනමාධ්‍ය සම්බන්ධයෙන් ඉදිරිපත් වූ ආකෘතියක් නොවේ.
(3) එය සමූහ සන්නිවේදනය පිළිබඳ වැඩි අවධානයක් යොමු කරයි.
(4) එය තොරතුරු හුවමාරුව ප්‍රකට කරයි.
(5) එය ග්‍රාහකයා පොළඹවා ගැනීම පිළිබඳ අවධානය යොමු කරයි.

**27.** ඉහත ආකෘතියෙහි දක්නට **නොලැබෙන** එහෙත්, හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ සන්නිවේදන ආකෘතියෙහි දක්නට ලැබෙන සන්නිවේදන ක්‍රියාවලියට අයත් මූලිකාංගයක් වන්නේ,
(1) නාලිකාවයි. (2) ප්‍රතිපෝෂණයයි. (3) බාධකයයි.
(4) අත්දැකීම් පසුතලයයි. (5) සම්ප්‍රේෂකයයි.

**28.** ඉහත **(26)** හා **(27)** ප්‍රශ්නවල සඳහන් සන්නිවේදන ආකෘතිවලින් ශ්‍රාම් සහ ඔස්ගුඩ්ගේ සන්නිවේදන ආකෘතිය වෙනස් වන්නේ, එමගින්
(1) බාධකවල ස්වභාවය ප්‍රකට කරන හෙයිනි.
(2) සංකේත පිළිබඳ අවධානය යොමු කරන හෙයිනි.
(3) ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය ගම්‍ය කරනු ලබන හෙයිනි.
(4) සම්ප්‍රේෂකයේ ක්‍රියාකාරීත්වය පෙන්වා දෙන හෙයිනි.
(5) අත්දැකීම් පසුතලය පිළිබඳව දක්වා ඇති හෙයිනි.

**29.** ඉහත **(26)**, **(27)** හා **(28)** ප්‍රශ්නවල සඳහන් කිසිදු ආකෘතියක දක්නට **නොමැති** එහෙත් ෂැනන් සහ විවර්ගේ සන්නිවේදන ආකෘතියෙහි දැකිය හැකි සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංගයක් වන්නේ,
(1) නාලිකාවයි. (2) බාධකයයි. (3) බලපෑමයි.
(4) ප්‍රතිපෝෂණයයි. (5) අවස්ථාවයි.

**30.** රාජ්‍ය ආයතනයක සිදු වූ අයථා ගනුදෙනුවක් පිළිබඳ අදාළ කරුණු තහවුරු කොටගෙන ජනතාව දැනුවත් කිරීමට පුවත්පත් කලාවේදියකු වන ඔබ අපේක්ෂා කරයි. ඒ සඳහා උපයෝගී කර ගත හැකි වඩාත් යෝග්‍ය නෛතික මූලාශ්‍රය වන්නේ,
(1) බුද්ධිමය දේපළ පනතයි.
(2) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතයි.
(3) තොරතුරු දැනගැනීමේ පනතයි.
(4) මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයයි.
(5) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (i) (අ) අනු ව්‍යවස්ථාවයි.

**31.** සමීක්ෂණයක වාර්තාව කියවන්නකුට වැදගත් විය හැකි අමතර ලේඛන ආදිය ඇතුළත් කළ යුත්තේ,
(1) හැඳින්වීමටයි.
(2) ක්‍රමවේදයටයි.
(3) දත්ත විශ්ලේෂණයටයි.
(4) උපග්‍රන්ථයටයි.
(5) ආශ්‍රේය මූලාශ්‍රයන්ටයි.

**32.** නිර්මහාපරිමාණකරණය පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.

*A* - එය විසිවන සියවසේ අග භාගයේ වර්ධනය වී විසිඑක්වන සියවසේ තවදුරටත් ව්‍යාප්ත විය.

*B* - වීඩියෝ ක්‍රීඩා සහ මාර්ගගත ක්‍රීඩා මෙම ක්‍රියාවලියේ ව්‍යාප්තියට දායක වී තිබේ.

*C* - අසමාන හා විවිධත්වයෙන් යුත් ග්‍රාහක ක්ෂේත්‍රයක් නිර්මාණය වේ.

*D* - තමාගේ රුචියට අනුව සංදේශ තෝරා ගැනීමක් වෙනුවට එම සංදේශවලට අනිවාර්ය ලෙස නිරාවරණය වීමක් මෙහිදී දැකිය හැකි ය.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,

(1) *A* හා *B* පමණි.
(2) *C* හා *D* පමණි.
(3) *A*, *B* හා *C* පමණි.
(4) *B*, *C* හා *D* පමණි.
(5) *A*, *B*, *C* හා *D* යන සියල්ලම ය.

**33.** ජනප්‍රිය සංස්කෘතිය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ජනප්‍රිය සංස්කෘතිය තුළ ජන සංස්කෘතියේ ශේෂයන් අන්තර්ගත වේ.
(2) ජන සංස්කෘතිය කිසිවිටකත් ජනප්‍රිය සංස්කෘතිය යන්නට පර්යාය පදයක් ලෙස නොසැලකේ.
(3) සම්භාව්‍ය සංස්කෘතියට ජනතාව සමීප කරවීම ජනප්‍රිය සංස්කෘතියේ මෙහෙවරකි.
(4) කර්මාන්තයක් ලෙස වර්ධනය වීමට ඊට ඇත්තේ සාපේක්ෂ අඩු විභවතාවකි.
(5) නිශ්චිත ස්ථානයක් හා කාලයක් වෙන් කර ගත යුතු වීම එහි මූලික ලක්ෂණයකි.

**34.** නිර්වාචික සන්නිවේදනය පිළිබඳ පන්තියේ දී සිසුන් අතර මතු වූ අදහස් කිහිපයක් පහත දැක්වේ.

රවි - සංඥා සංකේත භාවිතයට ගනියි.

කමලා - ඡායාරූප හා පෝස්ටර් මෙයට ඇතුළත් නොවෙයි.

රුවිනා - ජනවර්ගවලට අනුව මෙය වෙනස් විය හැකි ය.

නිර්වාචික සන්නිවේදනය පිළිබඳ නිවැරදි අදහස් දක්වා ඇත්තේ,

(1) රවි පමණි. (2) කමලා පමණි. (3) රුවිනා පමණි.
(4) රවි සහ රුවිනා පමණි. (5) රවි, කමලා හා රුවිනා යන සියල්ලන්ම ය.

**35.** සිනමා වැඩමුළුවක දී ගුරුතුමා ශිෂ්‍යයෙකුට පැවසුවේ, චිත්‍රපටයක ප්‍රධාන චරිතය ජීවත් වන පරිසරයේ සුන්දරත්වය විදහා දැක්වෙන රූප රාමුවක් ලබා ගත යුතු බවයි. ඒ සඳහා වඩාත් සුදුසු රූප රාමුව වන්නේ,

(1) දුර රූපයකි.
(2) මධ්‍යම රූපයකි.
(3) සමීප රූපයකි.
(4) ඉතා සමීප රූපයකි.
(5) මධ්‍යම සමීප රූපයකි.

**36.** එක්තරා රූපවාහිනී ආයතනයක හිමිකරුවෙක් එම සමාගම ආරම්භ කොට වසර 5කට පසු වෙනත් අයකුට විකුණා දමන ලදී. මෙම තත්ත්වයට අදාළ වන මාධ්‍ය ප්‍රවණතාව වන්නේ,

(1) නිර්නියාමනයයි.
(2) පරිභෝජ්‍යකරණයයි.
(3) වාණිජකරණයයි.
(4) භාණ්ඩකරණයයි.
(5) ගෝලීයකරණයයි.

**37.** සමීක්ෂණ වාර්තාවක හැඳින්වීමේ කොටසට ඇතුළත් කළ යුත්තේ කුමක් ද?

(1) සමීක්ෂණය සඳහා භාවිත කළ දත්ත රැස් කළ විධි පිළිබඳ විස්තර
(2) සමීක්ෂණය සඳහා භාවිත කළ මූලාශ්‍ර පිළිබඳ විස්තර
(3) දත්ත රැස් කිරීමට යොදා ගත් නියැදිය පිළිබඳ විස්තර
(4) සමීක්ෂණ ක්‍රියාවලියට පසුබිම් වූ ගැටලුව පිළිබඳ විස්තර
(5) දත්ත විශ්ලේෂණය ඇසුරෙන් අනාවරණය කර ගත් කරුණු

**38.** මාධ්‍ය පිළිබඳ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

*A* - සරල බස්වහර භාවිතය
*B* - බහුවිධ ග්‍රාහකත්වය
*C* - ප්‍රමාදිත ප්‍රතිපෝෂණය
*D* - අත්දැකීම් පාදක වීම

ඉහත ලක්ෂණ පිළිබඳ වඩාත් නිවැරදි වරණය කුමක් ද?

(1) *A* හා *B* සම්ප්‍රදායික මාධ්‍යයට අයත් ය.
(2) *A* හා *C* සම්ප්‍රදායික මාධ්‍යයට අයත් ය.
(3) *B* හා *C* ජනමාධ්‍යට අයත් ය.
(4) *A* හා *C* සම්ප්‍රදායික මාධ්‍යයට අයත් වන අතර *B* හා *D* ජනමාධ්‍යට අයත් ය.
(5) *A* හා *D* සම්ප්‍රදායික මාධ්‍යයට අයත් වන අතර *B* හා *C* ජනමාධ්‍යට අයත් ය.

**39.** මාධ්‍ය සංස්කෘතිය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) සමාජ අවශ්‍යතා මත තත්වාරෝපණය නොවන්නකි.
(2) ජනමාධ්‍ය ආරම්භයත් සමග බිහි වී වර්ධනය වූවක් නොවේ.
(3) 'තොරතුරු සමාජයේ සංස්කෘතිය' ලෙස හැඳින්විය නොහැකි ය.
(4) මානව සමාජ පරිනාමයේ විඥාපන අවධියට අයත් නොවූවකි.
(5) පුද්ගල සමාජානුයෝජනයට සහ සංස්කෘතික ක්‍රියාවලියට උපකාරී නොවන්නකි.

**40.** මාධ්‍ය පිළිබඳ ස්ත්‍රීවාදී විචාරය හා සම්බන්ධ **සදොස්** ප්‍රකාශය තෝරන්න.

(1) ස්ත්‍රී අයිතිවාසිකම් සම්බන්ධ ලිංගිකත්ව සමානාත්මතාව එහි පදනමයි.
(2) එය මාධ්‍ය මගින් කාන්තාවන්ට වෙනස් කොට සැලකීම පිළිබඳ අවධානය යොමු කරයි.
(3) මාධ්‍ය මගින් ස්ත්‍රිය ඒකාකෘතික ලෙස නිරූපණය කළ යුතු බව මෙමගින් පිළිගැනේ.
(4) ස්වාභාවික ලෙස ස්ත්‍රීත්වය මාධ්‍ය මගින් නිරූපණය නොකරන බව මෙහි දී ඉස්මතු කරයි.
(5) ස්ත්‍රීත්වය පිළිබඳ වටිනාකම් ව්‍යාප්ත කිරීම උදෙසා මාධ්‍ය දායක විය යුතු බව මෙමගින් පිළිගැනේ.

**41.** මහජන සම්බන්ධතාවේ දී "සන්නිවේදනය මගින් කිසිවක් නොසැඟවිය යුතු ය" යන අදහස වඩාත් ඉස්මතුව දැක්වෙන්නේ,

(1) ප්‍රචාරණ ආකෘතියේ දී ය.
(2) මහජන තොරතුරු ආකෘතියේ දී ය.
(3) පුවත් නියෝජිත ආකෘතියේ දී ය.
(4) ද්විමාර්ගික සමමිතික ආකෘතියේ දී ය.
(5) ද්විමාර්ගික අසමමිතික ආකෘතියේ දී ය.

**42.** තොරතුරු අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස තහවුරු කරන ලද දේශීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කුමක් ද?

(1) 13 වන සංශෝධනය
(2) 15 වන සංශෝධනය
(3) 18 වන සංශෝධනය
(4) 19 වන සංශෝධනය
(5) 20 වන සංශෝධනය

**43.** විජය නිවාසයේ ක්‍රීඩකයෙක් වන නිමල් ට ක්‍රීඩා උත්සවයේ සිද්ධි කළමනාකාර තනතුර පැවරිණි. නිමල්ගේ කාර්යයට අවම අදාළත්වයක් දක්වන්නේ,

(1) අර්බුද අවස්ථා කළමනාකරණයයි.
(2) ඉලක්ක කණ්ඩායම් හඳුනාගැනීමයි.
(3) ස්ථානයක් වෙන් කර ගැනීමයි.
(4) අයවැය තීරණය කිරීමයි.
(5) නිවේදන කටයුතු සිදු කිරීමයි.

**44.** මාධ්‍ය නියාමන ප්‍රවේශ හා ලක්ෂණ කිහිපයක් පහත වගුවෙහි දැක්වේ.

| | ප්‍රවේශය | | ලක්ෂණය |
|---|---|---|---|
| A | ස්වයං නියාමනය | X | ඇඩි දේශපාලන බලයක් සහිත වේ |
| B | සහනියාමනය | Y | රාජ්‍ය මැදිහත්වීමෙන් තොර වේ |
| C | ව්‍යවස්ථාපිත නියාමනය | Z | නීතිය මගින් ස්ථාපිතයි |

ඉහත නියාමන ප්‍රවේශවලට අදාළ නිවැරදි ලක්ෂණ ගලපා ඇති වරණය තෝරන්න.

(1) AX , BZ, CY (2) AX, BY, CZ (3) AY, BZ, CX
(4) AY, BX, CZ (5) AZ, BY, CX

**45.** ජනමාධ්‍යයේ කාර්යභාරය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) අවධානයෙන් සිටිමින් තොරතුරු සම්පාදනය සුපරීක්ෂණයයි.
(2) විවිධ සිද්ධීන් විවරණය කරමින් ඉදිරිපත් කිරීම තොරතුරු සම්පාදනයයි.
(3) පුද්ගල, සමාජ හැසිරීම් හා සිතුම් පැතුම්වල වෙනසක් ඇති කරවීම සමාජානුයෝජනය යි.
(4) පුද්ගලයින් හා විවිධ ආයතන අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා වර්ධනය කිරීම උපදෙස් සම්පාදනය යි.
(5) සමාජ වටිනාකම් පිළිබඳ ජනතාව දැනුවත් කර පොදු ගැටලු හා අභියෝග හඳුනාගැනීමට සැලැස්වීම තොරතුරු සම්පාදනයයි.

**46.** එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ඉදිරිපත් කළ අන්තර් සම්බන්ධිත සංවර්ධනය සඳහා වන සන්නිවේදන ප්‍රවේශයක් **නොවන්නේ,**

(1) නියාමනය සඳහා සන්නිවේදනයයි.
(2) සමාජීය වෙනස්කම් සඳහා සන්නිවේදනයයි.
(3) පාරිසරික සමතුලිතතාව සඳහා සන්නිවේදනයයි.
(4) හැසිරීම් වෙනස්කම් සඳහා සන්නිවේදනයයි.
(5) දරිද්‍රතාව අවම කිරීම සඳහා සන්නිවේදනයයි.

**47.** රූපලාවන්‍ය නිෂ්පාදන අලෙවි කරන සමාගමකට අයත් වෙබ් අඩවියකට තමන්ගේ බැංකු ගිණුම් විස්තර ඇතුළත් කිරීම නිසා මූල්‍ය වංචාවකට හසු වී ඇති බව නිමාලිට වැටහිනි. මේ පිළිබඳව විසඳුමක් ලබා ගැනීමට ඇය පැමිණිලි කළ යුත්තේ,

(1) අදාළ රූපලාවන්‍ය නිෂ්පාදන සමාගමටයි.
(2) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසමටයි.
(3) සිය ගිණුම අයත් බැංකුවටයි.
(4) ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයටයි.
(5) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමටයි.

**48.** සමීක්ෂණ වාර්තාවක් ලිවීමේ දී එම අධ්‍යයනය සඳහා පරිශීලනය කරන ලද මූලාශ්‍ර පිළිබඳ තොරතුරු ඇතුළත් කළ යුතු ය. එම මූලාශ්‍රය ග්‍රන්ථයක් නම්, ආශ්‍රේය මූලාශ්‍ර දැක්වීමේ දී වැදගත්කමක් හිමි **නොවන්නේ,**

(1) කර්තෘ නාමයට හා ග්‍රන්ථ නාමයට ය.
(2) ග්‍රන්ථ නාමයට හා ප්‍රකාශිත වර්ෂයට ය.
(3) ප්‍රකාශිත වර්ෂයට හා ප්‍රකාශිත ආයතනයට ය.
(4) ප්‍රකාශිත ආයතනයට හා ස්ථානයට ය.
(5) මුද්‍රණකරු හා බෙදාහරින්නන්ට ය.

**49.** සංකේත පිළිබඳ නිදොස් ප්‍රකාශය තෝරන්න.

(1) ඇතැම් සංකේත දෘශ්‍යමාන නොවේ.
(2) ඉඟි හා ඉරියව් සංකේත නොවේ.
(3) සංකේත වැරදුන විට සන්නිවේදනයක් සිදු නොවේ.
(4) හැඟීම් දැනවීමට සංකේත අවශ්‍ය නොවේ.
(5) ගන්ධය සංකේතයක් ලෙස ගිණිය හැකි නොවේ.

**50.** පුද්ගලයකුට තම අවශ්‍යතා, දැනුම හා කුසලතා ගොඩනගා ගැනීමට වැදගත් වන කාර්ය පිළිබඳ විශාරදත්වය බෙහෙවින් ප්‍රයෝජනවත් ය. එය වර්ධනය කර ගැනීමට ඇති අවශ්‍යතාව අදාළ වන්නේ,

(1) අවශ්‍යතා කේන්ද්‍රීයත්වයට ය.
(2) සංවර්ධනය සඳහා වන සන්නිවේදන අපේක්ෂාවන්ට ය.
(3) ස්වයං-නිර්ණය හා සම්බන්ධ නිපුණතාවන්ට ය.
(4) සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය හා සම්බන්ධ සවිඥානිකත්වයට ය.
(5) යහපත් පරිසරයක් ගොඩනැගීම හා සම්බන්ධ පරිසර විද්‍යාත්මක සමබරතාවට ය.

* * *

42344

AL/2024/29/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II
தொடர்பாடலும் ஊடகக் கற்கையும் II
Communication & Media Studies II

29 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**
※ ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව **40**කි.

**1.** සන්නිවේදන අධ්‍යයනයේ දී සාම්ප්‍රදායික මාධ්‍ය මෙන්ම ජනමාධ්‍ය පිළිබඳව ද අවධානය යොමු කෙරේ.

(i) 'සන්නිවේදන අධ්‍යයනය' නම් ස්වාධීන විෂයයේ සංවර්ධනයට පසුබිම සකස් කළ ප්‍රධාන විෂය ක්ෂේත්‍ර **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) සන්නිවේදන ක්‍රියාවලියේ මූලික අංග ලෙස සැලකෙන ආකේතකරණයේ දී හා විකේතකරණයේ දී සිදුවන්නේ කුමක් දැයි වෙන වෙනම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) සාම්ප්‍රදායික සන්නිවේදනයේ වැදගත්කම කරුණු **තුනක්** ඇසුරින් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iv) ජනසන්නිවේදනයේ පවත්නා විශේෂතා **හතරක්** අන්තර්පුද්ගල සන්නිවේදනය හා සංසන්දනය කරමින් සාකච්ඡා කරන්න. (ලකුණු 16)

**2.** (i) මානව සන්නිවේදනයේ දී නාලිකා ලෙස භාවිත කරන්නේ මොනවා ද? (ලකුණු 04)

(ii) මහජන සන්නිවේදනයේ ප්‍රයෝජන **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) නිර්මාණශීලී රචනය පහත සාධක ඇසුරෙන් ලුහුඬින් විස්තර කරන්න.

(අ) නිර්මාණශීලී රචනාවක අරමුණු

(ආ) නිර්මාණශීලී රචනා වර්ග

(ඉ) නිර්මාණශීලී භාෂා ශෛලිය (ලකුණු 12)

(iv) මහජන සම්බන්ධතා මෙවලම් **දෙකක්** හා විධික්‍රම **දෙකක්** නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 16)

**3.** පාසල් සිසුන්ගේ කාව්‍ය නිර්මාණ ඇතුළත් කර සම්පාදනය කළ ග්‍රන්ථයක දොරට වැඩුම සඳහා සහභාගී වීමට ඔබට ආරාධනයක් ලැබී ඇත.

(i) කාව්‍ය නිර්මාණකරණය සඳහා භාවිත වන සන්නිවේදන වර්ගය කුමක් ද? (ලකුණු 04)

(ii) ඉහත (i) හි ඔබ සඳහන් කරන ලද සන්නිවේදන වර්ගය භාවිත කිරීමේ ප්‍රයෝජන **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) නිර්මාණකරණය සඳහා වැදගත්වන ගුණාංග දෙකක් පහතින් දැක්වේ. ඒවා පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

(අ) පරිකල්පනය

(ආ) සතතාභ්‍යාසය (ලකුණු 12)

(iv) දොරට වැඩුම උත්සවය සංවිධාන කිරීම සඳහා සිද්ධි කළමනාකරුවෙක් ලෙස ඔබ කටයුතු කරන්නේ නම් එම උත්සවය සැලසුම් කිරීමට අදාළ කාර්ය **හතරක්** විස්තර කරන්න. (ලකුණු 16)

[දෙවැනි පිටුව බලන්න

**4.** සංවර්ධනය හා සංස්කෘතිය ආශ්‍රිත ක්‍රියාකාරකම් සන්නිවේදනය සමඟ අවියෝජනීය ලෙස බැඳී පවතී.

(i) සංවර්ධන කාර්යයේ දී ඒ ඒ රටවලට යෝග්‍ය වූ විධික්‍රම අදාළ රටවල් විසින්ම නිර්මාණය කර ක්‍රියාත්මක කිරීම හැඳින්වීම සඳහා භාවිත යෙදුම කුමක් ද? (ලකුණු 04)

(ii) 'සංස්කෘතිය' යන්න ඊ. බී. ටයිලර්ගේ නිර්වචනය ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) පාර්ශ්ව දෙකක් හෝ කිහිපයක් අතර ඇති විය හැකි ගැටුම් නිරාකරණය කිරීම සඳහා පහත පියවර යොදා ගන්නා ආකාරය විස්තර කරන්න.

(අ) ගැටුම අවබෝධ කර ගැනීම

(ආ) විසඳුමක් තෝරා ගැනීම

(ඉ) මැදිහත්කරුවකු ලෙස තෙවන පාර්ශ්වයක් යොදා ගැනීම (ලකුණු 12)

(iv) ජනප්‍රිය සංස්කෘතියේ දක්නට ලැබෙන පහත ලක්ෂණ රූපවාහිනී මාධ්‍යට විශේෂිතව නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(අ) නොගැඹුරු හා සරල වීම

(ආ) මහා පරිමාණිකව නිෂ්පාදනය වීම

(ඉ) කලාත්මක මට්ටම හීන වීම

(ඊ) සදාචාරාත්මක ගැටලුවලට හේතු වීම (ලකුණු 16)

**5.** 'මාධ්‍ය නියාමනයේ සමාජ අවශ්‍යතාව' මැයෙන් සිදුකරන මත විමසීමේ සමීක්ෂණයක දත්ත රැස්කරන්නෙක් ලෙස ඔබ කටයුතු කරන්නේ යැයි සිතන්න.

(i) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක මාධ්‍ය නියාමන ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) මූලික සමීක්ෂණ වර්ග **දෙක** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ඉහත සමීක්ෂණය සඳහා දත්ත රැස්කිරීමේ දී අනුගමනය කළ යුතු ආචාරධර්ම **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)

(iv) ශ්‍රී ලංකාව තුළ මාධ්‍ය නියාමනයේ අවශ්‍යතාව පහත කරුණු යටතේ උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න.

(අ) මහජන සාමය ආරක්ෂා කිරීම

(ආ) තනි පුද්ගල අයිතීන්ට සිදු වන බලපෑම පාලනය කිරීම (ලකුණු 16)

**6.** මානව සන්නිවේදන ක්‍රියාවලිය කාලානුරූපීව නවීකරණය වෙයි.

(i) සම්ප්‍රදායික මාධ්‍යවල ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 04)

(ii) සන්නිවේදනය සඳහා භාවිත සමාජ මාධ්‍ය යෙදවුම් **දෙකක** ක්‍රියාකාරීත්වය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) මාධ්‍ය අන්තර්ගතය නිර්මාණය කිරීමේ දී කෘත්‍රිම බුද්ධිය (Artificial Intelligence) යොදා ගත හැකි ආකාරය පහත අවස්ථාවලට විශේෂිතව විස්තර කරන්න.

(අ) ගීත නිර්මාණකරණය

(ආ) රූපවාහිනී වැඩසටහන් ඉදිරිපත් කිරීම (ලකුණු 12)

(iv) නිර්මහාපරිමාණකරණයේ ලක්ෂණ පහත මාධ්‍යවලට විශේෂිතව නිදසුන් දක්වමින් පහදන්න.

(අ) මුද්‍රිත මාධ්‍ය

(ආ) සමාජ මාධ්‍ය (ලකුණු 16)

**7.** මාධ්‍ය සාක්ෂරතාව හා මාධ්‍ය විචාරය අතර සමීප සම්බන්ධතාවක් පවතී.

(i) සාක්ෂරතාව යනු කුමක් ද? (ලකුණු 04)

(ii) ඥාන ව්‍යුහ ගොඩනගා ගැනීමට තොරතුරු ඉවහල්වන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) මාධ්‍ය හා සම්බන්ධ ස්ත්‍රීවාදී විචාරයෙහි ඔබ හඳුනා ගන්නා ප්‍රධාන ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iv) මාධ්‍ය සන්දේශ විශ්ලේෂණය කිරීම සඳහා පහත අංග යොදා ගන්නා ආකාරය උදාහරණ ඇසුරෙන් විමසන්න.

(අ) අදාළ බව (ආ) පෙළඹවීම

(ඉ) විශ්වසනීයත්වය (ඊ) විකෘතිකරණය (ලකුණු 16)

***

සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2024

# 29 - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන / සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# 29 - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

**I පත්‍රය** = කාලය පැය 02 යි

වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50 කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.
එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 50 කි.

**II පත්‍රය** = කාලය පැය 03 යි

ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 07 කින්, 05 කට පිළිතුරු සැපයිය යුතුය.
එක් ප්‍රශ්නයකට ලකුණු 40 බැගින් මුළු ලකුණු 200 කි.

**අවසාන ලකුණු ගණනය කිරීම :**

| | | |
|---|---|---|
| **I පත්‍රය** | = | 50 |
| **II පත්‍රය** 200 ÷ 4 | = | 50 |
| **අවසාන ලකුණු** | = | 100 |

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන්ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ ☐ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ :ප්‍රශ්න අංක 03

(i) ............................................................ √ △ $\frac{4}{4}$

(ii) ............................................................ √ △ $\frac{8}{8}$

(iii) ............................................................ √ △ $\frac{12}{12}$

(iv) ............................................................ √ △ $\frac{16}{16}$

(03) (i) $\frac{4}{4}$ + (ii) $\frac{8}{8}$ + (iii) $\frac{12}{12}$ + (iv) $\frac{16}{16}$ = ☐ $\frac{40}{40}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර ✗ ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණු ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

**අ.පො.ස. (උ.පෙළ) විභාගය / க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2024**

**විෂය අංකය** 
பாட இலக்கம் **29**

**විෂයය** 
பாடம் **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය**

## ලකුණු දීමේ පටිපාටිය / புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය / பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 2 | 21. | 3 | 31. | 4 | 41. | 2 |
| 02. | 4 | 12. | 4 | 22. | 4 | 32. | 3 | 42. | 4 |
| 03. | 5 | 13. | 2 | 23. | 5 | 33. | 1 | 43. | 5 |
| 04. | 4 | 14. | 2 | 24. | 2 | 34. | 4 | 44. | 3 |
| 05. | 5 | 15. | 5 | 25. | 3 | 35. | 1 | 45. | 1 |
| 06. | 1 | 16. | 5 | 26. | 4 | 36. | 1 | 46. | 5 |
| 07. | 1 | 17. | 2 | 27. | 1 | 37. | 4 | 47. | 4 |
| 08. | 4 | 18. | 3 | 28. | 3 | 38. | 5 | 48. | 5 |
| 09. | 4 | 19. | 1 | 29. | 2 | 39. | 2 | 49. | 1 |
| 10. | 3 | 20. | 5 | 30. | 3 | 40. | 3 | 50. | 3 |

✪ විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට / ஒரு சரியான விடைக்கு ලකුණු 01 බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் 01 × 50 = 50

**1.** සන්නිවේදන අධ්‍යයනයේ දී සාම්ප්‍රදායික මාධ්‍ය මෙන්ම ජනමාධ්‍ය පිළිබඳව ද අවධානය යොමු කෙරේ.

(i) 'සන්නිවේදන අධ්‍යයනය' නම් ස්වාධීන විෂයයේ සංවර්ධනයට පසුබිම් සකස් කළ ප්‍රධාන විෂය ක්ෂේත්‍ර **දෙකක්** නම් කරන්න.

- සමාජ විද්‍යාව
- දේශපාලන විද්‍යාව
- මනෝ විද්‍යාව

ලකුණු 2 x 2 = 4

(ii) සන්නිවේදන ක්‍රියාවලියේ මූලික අංග ලෙස සැලකෙන ආකේතකරණයේ දී හා විකේතකරණයේ දී සිදුවන්නේ කුමක් දැයි වෙන වෙනම කෙටියෙන් විස්තර කරන්න.

- **ආකේතකරණය** - සිතේ අතිවන අදහස්, හැඟීම් තවත් පාර්ශ්වයක් සමග සන්නිවේදනය කිරීම සඳහා සේත උපයෝගී කර ගනිමින් ඒවා සන්දේශ බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය
- **විකේතකරණය** - සන්දේශයේ අන්තර්ගතය අර්ථකථනය කර අවබෝධ කර ගැනීමේ ක්‍රියාවලිය

ලකුණු 4 x 2 = 8

(iii) සාම්ප්‍රදායික සන්නිවේදනයේ වැදගත්කම කරුණු **තුනක්** ඇසුරින් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

- දැනුම් හා ඉගෙනුම් සම්පාදනය
- භාව ප්‍රකාශනය
- උපදේශාත්මක සංදේශ ජනනය කළ හැකිවීම
- සංස්කෘතිකාංග හුවමාරු කර ගැනීමට හැකිවීම
- අහිතකර සමාජ ප්‍රවණතා විවේචනය කිරීම
- විනෝදාස්වාදය සඳහා යොදා ගත හැකිවීම

විස්තර කිරීම ලකුණු 3 x 3 =
උදාහරණ දැක්වීම 1 x 3 =
මුළු ලකුණු

(iv) ජනසන්නිවේදනයේ පවත්නා විශේෂතා **සතරක්** අන්තර්පුද්ගල සන්නිවේදනය හා සංසන්දනය කරමින් සාකච්ඡා කරන්න.

| ජනසන්නිවේදනය | අන්තර් පුද්ගල සන්නිවේදනය |
|---|---|
| • තාක්ෂණික මෙවලම් භාවිතය | • තාක්ෂණික මෙවලම් භාවිත කර හෝ තොරව සිදුකළ හැකිවීම |
| • වෘත්තීය සන්නිවේදකයින් සිටීම | • වෘත්තීය සන්නිවේදකයින් නොවීම |
| • ප්‍රමාදිත ප්‍රතිපෝෂණය | • ක්ෂණික ප්‍රතිපෝෂණය |
| • පොදු සන්දේශ බෙදාහැරීම | • පෞද්ගලික සංදේශ හුවමාරුව |
| • බහුවිධ දොරටුපාල ක්‍රියාවලියට යටත්වීම | • නිදහසේ සංදේශ හුවමාරු කර ගැනීමට හැකිවීම |
| • සන්නිවේදක හා ග්‍රාහකයා අතර දුරස්ථභාවයක් පැවතීම | • සන්නිවේදක හා ග්‍රාහකයා අතර සමීප බවක් දක්නට ලැබීම |
| • බොහෝවිට ඒකමාර්ගික වේ | • ද්වි මාර්ගික සන්නිවේදන ක්‍රියාවලියකි |
| • ආයතනගත ව්‍යුහයක් දක්නට ලැබීම | • ආයතනගත ව්‍යුහයක් දක්නට නොලැබීම |
| • අඛණ්ඩ බවකින් යුක්ත වීම | • අවශ්‍යතාව මත පදනම් වීම |
| • විසිරුණු, පැතිරුණු පුළුල් ග්‍රාහක ක්ෂේත්‍රයක් පැවතීම | • එසේ නොවීම |

ලකුණු 4 x 4 = 16

2. (i) මානව සන්නිවේදනයේ දී නාලිකා ලෙස භාවිත කරන්නේ මොනවා ද?

පංචේන්ද්‍රිය
(පංචේන්ද්‍රියට අයත් අංග තුනකට වඩා ලියා ඇත්නම් පමණක් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න)

ලකුණු = 4

(ii) මහජන සන්නිවේදනයේ ප්‍රයෝජන **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

- කිසියම් අරමුණක් සඳහා ජන සමූහයක් පොළඹවා ගැනීම
- ප්‍රස්තුත කරුණු පිළිබඳව වැඩිදුර දැනුවත් කිරීම
- ප්‍රතිරූප ගොඩනංවා ගැනීමට
- විවිධ පාර්ශ්වවල අවධානය දිනා ගැනීමට
- මතවාද නිර්මාණය කිරීමට

ලකුණු 4 x 2 = 8

(iii) නිර්මාණශීලී රචනය පහත සාධක ඇසුරෙන් ලුහුඬින් විස්තර කරන්න.

(අ) නිර්මාණශීලී රචනාවක අරමුණු

රසිකයාට, සිතුවිලි, හැඟීම් හා රස ලබා දෙමින් භාව පූර්ණ චිත්ත තත්වයක් ඇති කිරීම

(ආ) නිර්මාණශීලී රචනා වර්ග

ගීතය, නව කතාව, කෙටි කතාව, චරිතාපදාන, සාහිත්‍ය විචාර, තිර රචනය, ගුවන් විදුලි පිටපත් රචනය, තීරු ලිපි, විශේෂාංග, වෙළඳ දැන්වීම් පිටපත්

(ඉ) නිර්මාණශීලී භාෂා ශෛලිය

රසවත්වීම, ව්‍යංගාර්ථ පූර්ණ වීම, පරිකල්පනය පුබුදු කරවීම, ග්‍රාහක සිත් සනසවන සුළු බව, සිනහව, ප්‍රහර්ෂය, සන්තාපය වැනි සංවේදනා ඇති කරවන

ලකුණු 4 x 3 = 12

(iv) මහජන සම්බන්ධතා මෙවලම් **දෙකක්** හා විධික්‍රම **දෙකක්** නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

| මෙවලම් | විධික්‍රම |
|---|---|
| • ප්‍රවෘත්ති නිවේදන | • තෑගි ලබාදීම |
| • මාධ්‍ය කට්ටල | • සම්මාන පිරිනැමීම |
| • පොත් පිංච | • දිරි දීමනා |
| • විස්තර පත්‍රිකා | • උපදේශනය |
| • පුවත් හසුන | • අරමුදල් ලබාදීම |
| • වාර්ෂික වාර්තා | • මහජන මතය විමසීම |
| • ඡායාරූප | • විශේෂ සිද්ධි කළමනාකරණය |
| • වීඩියෝ සම්බන්ධතා | |
| • වීඩියෝ ප්‍රවෘත්ති නිකුත් කිරීම | |
| • අන්තර්ජාල මහජන සම්බන්ධතා | |
| • විද්‍යුත් මාධ්‍ය කට්ටල | |
| • විද්‍යුත් මාධ්‍ය මධ්‍යස්ථාන | |

මෙවලම් දෙකක් විස්තර කිරීම ලකුණු 3 x 2 = 6
උදාහරණ දැක්වීම ලකුණු 1 x 2 = 2
විධික්‍රම දෙකක් විස්තර කිරීම ලකුණු 3 x 2 = 6
උදාහරණ දැක්වීම ලකුණු 1 x 2 = 2
මුළු ලකුණු 16

**3.** පාසල් සිසුන්ගේ කාව්‍ය නිර්මාණ ඇතුළත් කර සම්පාදනය කළ ග්‍රන්ථයක දොරට වැඩුම සඳහා සහභාගී වීමට ඔබට ආරාධනයක් ලැබී ඇත.

**(i)** කාව්‍ය නිර්මාණකරණය සඳහා භාවිත වන සන්නිවේදන වර්ගය කුමක් ද?

අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය

ලකුණු = 4

**(ii)** ඉහත (i) හි ඔබ සඳහන් කරන ලද සන්නිවේදන වර්ගය භාවිත කිරීමේ ප්‍රයෝජන **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

- පෞරුෂ වර්ධනයට
- ස්ව - සංකල්පය පෝෂණයට
- චින්තනය ගොඩනංවා ගැනීමට
- ආත්ම විශ්වාසය ගොඩනැගීමට
- තීරණ ගැනීමට
- විචාරශීලීත්වය වර්ධනය කර ගැනීමට
- නිර්මාණශීලීත්වය ඔප් නංවා ගැනීමට
- ස්මරණය කිරීමට

(කෙටියෙන් විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ප්‍රදානය කරන්න)

ලකුණු 4 x 2 = 8

**(iii)** නිර්මාණකරණය සඳහා වැදගත්වන ගුණාංග දෙකක් පහතින් දැක්වේ. ඒවා පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

(අ) **පරිකල්පනය** - නිර්මාණකරණය සඳහා අවශ්‍ය සංකල්ප, චිත්ත රූප ගොඩනගා ගනු පිණිස නිර්මාණකරුවෙකු සතු ශක්තියයි. නිර්මාණාත්මකව අත්දැකීම් ඇසුරෙන් නිර්මාණයක් බිහි කිරීමේ දී පරිකල්පනය භාවිත කරමින් නිර්මාණාත්මක චින්තනයෙහි යෙදෙයි. තමා නිර්මාණය කිරීමට අපේක්ෂා කරන නිර්මාණයෙහි තේමාව හා මූලික දළ සැලැස්ම යනාදිය පිළිබඳ රූපයක් තම මනසෙහි ඇති කර ගැනීම.

(ආ) **සතතාභ්‍යාසය** - අඛණ්ඩව සිදු කරන අභ්‍යාසය යි. පුද්ගලයා තුළ විභව ශක්තියක් තිබුනද එය සංවර්ධනය කර ගැනීමට අභ්‍යාසය වැදගත් වේ. එය තමා විසින්ම සිදු කරගත යුත්තකි. මෙමගින් පරිකල්පනය වඩා සියුම් හා තියුණු තත්වයකට පත් කරගත හැකිය.

ලකුණු 6 x 2 = 12

| |
|---|
| (iv) දොරට වැඩුම උත්සවය සංවිධාන කිරීම සඳහා සිද්ධි කළමනාකරුවෙක් ලෙස ඔබ කටයුතු කරන්නේ නම් එම උත්සවය සැලසුම් කිරීමට අදාළ කාර්ය **හතරක්** විස්තර කරන්න. |

- සිද්ධි තේමාව/ ඉලක්කය හා අරමුණු හඳුනාගැනීමට
- මූල්‍ය පිරිවැය හා එය සැලසුම් කිරීම
- අනුග්‍රාහක අවස්ථා සැලසුම් කිරීම හා ලබාගැනීම
- ඉලක්ක කණ්ඩායම හඳුනා ගැනීම
- අදාළ අභ්‍යන්තර හා බාහිර පාර්ශ්ව සමග සම්බන්ධීකරණය ගොඩනැගීම
- පාරිභෝගික සේවා සැලසුම් කිරීම
- හදිසි අවස්ථා සැලසුම් කිරීම
- ආරක්ෂාව පිළිබඳ අවධානය යොමු කිරීම
- පිටපත ලිවීම
- ස්ථානයක් වෙන් කරගැනීම
- ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන් නිෂ්පාදනය
- ප්‍රවර්ධන කටයුතු සැලසුම් කිරීම
- න්‍යායපත්‍රය සැකසීම

ලකුණු 4 X 4 = 16

**4. සංවර්ධනය හා සංස්කෘතිය ආශ්‍රිත ක්‍රියාකාරකම් සන්නිවේදනය සමඟ අවියෝජනීය ලෙස බැඳී පවතී.**

**(i) සංවර්ධන කාර්යයේ දී ඒ ඒ රටවලට යෝග්‍ය වූ විධික්‍රම අදාළ රටවල් විසින්ම නිර්මාණය කර ක්‍රියාත්මක කිරීම හැඳින්වීම සඳහා භාවිත යෙදුම කුමක් ද?**

ප්‍රදේශීයකරණය

ලකුණු = 4

**(ii) 'සංස්කෘතිය' යන්න ඊ. බී. ටයිලර්ගේ නිර්වචනය ඇසුරෙන් පැහැදිලි කරන්න.**

දැනුම, ඇදහිලි, කලා, නීති, සදාචාර, සිරිත් විරිත් හා මිනිසා සමාජයේ ජීවත්වන පුද්ගලයෙකු වශයෙන් ලබාගත් අනෙකුත් කුමන විධියක හෝ පුරුදු හෝ හැකියාවන් ඇතුළත් සංකීර්ණ සමස්තය යි.

(ඉහත නිර්වචනයේ අන්තර්ගත කරුණු ඇසුරින් සංස්කෘතිය යන්න පැහැදිලි කර තිබිය යුතුය.)

නිර්වචනයට ලකුණු = 4
විස්තර කිරීම ලකුණු = 4
මුළු ලකුණු = 8

**(iii) පාර්ශ්ව දෙකක් හෝ කිහිපයක් අතර ඇති විය හැකි ගැටුම් නිරාකරණය කිරීම සඳහා පහත පියවර යොදා ගන්නා ආකාරය විස්තර කරන්න.**

(අ) ගැටුම අවබෝධ කර ගැනීම

- ගැටුමට හේතු වූ කරුණ අවබෝධ කර ගැනීම
- ගැටුමේ තීව්‍රතාව හා එයට සම්බන්ධ වූ පාර්ශව හඳුනා ගැනීම
- සිදුවීමට අදාළ වටපිටාව/ සන්දර්භය හඳුනාගැනීම

(ආ) විසඳුමක් තෝරා ගැනීම

- ගැටුම නිරාකරණය කරගැනීමට යෝජනා කළ හැකි විසඳුම් කවරේදැයි තීරණය කිරීම
- අදාළ විසඳුම් ඇගයීම
- වඩාත් යෝග්‍ය විසඳුම් තෝරාගැනීම

(ඉ) මැදිහත්කරුවකු ලෙස තෙවන පාර්ශ්වයක් යොදා ගැනීම

- අදාළ සිද්ධිය/ පරිසරය පිළිබඳ දැනුමක්/ අවබෝධයක් සහිත පුද්ගලයෙකු පිළිබඳ අවධානය යොමු කිරීම
- ගැටුම් නිරාකරණය කිරීම සඳහා එකී පුද්ගලයාට ඇති ශක්‍යතාව තහවුරු කරගැනීම
- පාර්ශව දෙක අතර සම්බන්ධතාව හා සන්නිවේදනය සඳහා යෝග්‍ය මධ්‍යස්ථ තුන්වන පාර්ශවයක් මැදිහත්කරුවෙකු ලෙස තෝරා ගෙන අවශ්‍ය කටයුතු කිරීමට එකී තැනැත්තාට අවස්ථාව සලසාදීම

ලකුණු 4 x 3 = 12

**(iv) ජනප්‍රිය සංස්කෘතියේ දක්නට ලැබෙන පහත ලක්ෂණ රූපවාහිනී මාධ්‍යට විශේෂිතව නිදසුන් සහිතව පැහැදිලි කරන්න.**

**(අ) නොගැඹුරු හා සරල වීම**

- රූපවාහිනියේ විකාශය වන සන්දේශ සාමාන්‍ය ග්‍රාහකයාට පහසුවෙන් තේරුම් ගත හැකි ලෙස ඉදිරිපත්වීම. වඩාත් සංකීර්ණ හා දුරාවබෝධ දෑ අන්තර්ගත නොවීම.
  උදා- රියලිටි වැඩසටහන්, මෙගා ටෙලිනාට්‍ය
- සරළ භාෂා භාවිතය හා ජනප්‍රිය ආකෘති යොදාගැනීම

**(ආ) මහා පරිමාණිකව නිෂ්පාදනය වීම**

- ග්‍රාහක අවශ්‍යතා/ රුචි අරුචිකම් වලට ගැළපෙන විවිධාකාර වැඩසටහන් විශාල ප්‍රමාණයෙන් නිෂ්පාදනය කිරීම

**(ඉ) කලාත්මක මට්ටම හීන වීම**

- සෞන්දර්යාත්මක වටිනාකම පිළිබඳ අවධානය අඩුවීම
- අඩු මුදලක්, අඩු කාලයක් වැය කර නිර්මාණ ඉදිරිපත් කිරීමට පෙළඹීම නිසා කලාත්මක මට්ටම හීනවීම
- අත්දැකීම්, පුහුණුව, පළපුරුද්ද සහිත ප්‍රවීණ වෘත්තිකයන්ගේ දායකත්වය අඩුවීම ද ඊට හේතු විය හැකිය.

  උදා- මෙගා ටෙලිනාට්‍ය, රියැලිටි වැඩසටහන්

**(ඊ) සදාචාරාත්මක ගැටලුවලට හේතු වීම**

- සම්මත ඇවතුම් පැවතුම් පිළිබඳ අඩු අවධානයක් යොමු කිරීම
- ලාභ අපේක්ෂාව හේතුවෙන් ගුණාත්මක තත්වය පිළිබඳ අඩු සැලකිල්ලක් දැක්වීම
- භාවාත්මක, සංවේදී තොරතුරු නිර්මාණ සඳහා යොදාගැනීම නිසා මෙවැනි ගැටලු නිර්මාණයවීම

උදා- ටෙලිනාට්‍ය, රියැලිටි වැඩසටහන්, වෙළඳ දැන්වීම්

| | |
|---|---|
| විස්තර කිරීම ලකුණු | 3 x 4 = 12 |
| උදාහරණ දැක්වීම ලකුණු | 1 x 4 = 4 |
| මුළු ලකුණු | 16 |

**5.** 'මාධ්‍ය නියාමනයේ සමාජ අවශ්‍යතාව' මැයෙන් සිදුකරන මත විමසීමේ සමීක්ෂණයක දත්ත රැස්කරන්නෙක් ලෙස ඔබ කටයුතු කරන්නේ යැයි සිතන්න.

(i) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක මාධ්‍ය නියාමන ආයතන **දෙකක්** නම් කරන්න.

- ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලය
- ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
- ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
- ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය

ලකුණු 2 x 2 = 4

**(ii) මූලික සමීක්ෂණ වර්ග දෙක කෙටියෙන් පැහැදිලි කරන්න.**

- **විස්තරාත්මක සමීක්ෂණ :-**
  * විස්තරාත්මක සමීක්ෂණයක අරමුණු වන්නේ පවත්නා යම් තත්ත්වයක් හෝ සිදුවීමක් පිළිබඳව තොරතුරු එක්රැස් කර, ඒ පිළිබඳ විස්තර කිරීම හඳුනාගැනීම හෝ අර්ථකථනය කිරීමයි.
  * කිසියම් ගැටලුවක් පිළිබඳ විවිධ මාන වලින් තොරතුරු ඒකරාශී කිරීම
  * මෙම දත්ත, සිද්ධිය හෝ බලපෑම පිළිබඳ ගැඹුරින් අවධානය යොමු නොකරයි.
  * ගුණාත්මක හා ප්‍රමාණාත්මක තොරතුරු රැස් කරයි.
    උදා: රූපවාහිනී වෙළඳ දැන්වීම් ප්‍රමාණය, වර්ගය, කාලය ආදිය පිළිබඳව දත්ත රැස් කළ හැකිය.

- **විග්‍රහාත්මක සමීක්ෂණ :-**
  * විග්‍රහාත්මක සමීක්ෂණයක අරමුණු වන්නේ යම් පවත්නා තත්ත්වයක් හෝ සිදුවීමක් පිළිබඳව තොරතුරු එක්රැස් කර එම සිදුවීමට අදාළ හේතු හා ඒවායේ අන්තර් සම්බන්ධතා හඳුනා ගැනීම හා පැහැදිලි කිරීමයි.
  * කිසියම් ගැටලුවක් හෝ අවස්ථාවක් හෝ වැඩසටහනක් හෝ පිළිබඳව විද්‍යාත්මක ප්‍රවේශයකින් සොයා ගන්නා දත්ත අදාළ සමීක්ෂණයේ අරමුණුවලට යටත්ව විග්‍රහාත්මකව විමසා බලයි.
  * මෙහිදී ගැටලුවක් විවිධ මානවලින් විශ්ලේෂණය කරයි.

  උදා:
    - සමාජ මාධ්‍යයෙන් ප්‍රචලිත වන තොරතුරු මගින් සිදුවන සමාජ බලපෑම කෙබඳුද
    - වෙළඳ ප්‍රචාරණ දැන්වීමකින් භාණ්ඩයක් මිලදී ගැනීමේ දී ග්‍රාහකයාට සිදු කරන බලපෑම කෙබඳු ද? ආදී ගැටලු පිළිබඳ මෙමගින් විමසා බැලිය හැකිය.

ලකුණු 4 x 2 = 8

| | |
|---|---|
| **(iii)** | **ඉහත සමීක්ෂණය සඳහා දත්ත රැස්කිරීමේ දී අනුගමනය කළ යුතු ආචාරධර්ම තුනක් විස්තර කරන්න.** |

* දත්ත රැස් කිරීමේ දී ගුණාත්මකභාවය හා ප්‍රමිතිය ආරක්ෂා කර ගැනීම
* දත්ත හිතාමතා විකෘති නොකිරීම
* වැරදි දත්ත ඇතුළත් නොකිරීම
* දත්ත දායකයාගේ කැමැත්ත මත පමණක් සමීක්ෂණය සඳහා සහභාගී කර ගැනීම
* සමීක්ෂණය පිළිබඳ හා පර්යේෂණයේ මූලික අරමුණු පිළිබඳව දත්ත දායකයා දැනුවත් කිරීම
* දත්ත දායකයාගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම
* නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදීම
* දත්ත දායකයාගේ ආරක්ෂාව තහවුරු කිරීම
* දත්ත ලබා ගැනීමේ දී සමීක්ෂකගේ බලය අයුතු ලෙස යොදා නොගැනීම
* බුද්ධිමය දේපල අයුතු ලෙස භාවිත නොකිරීම
* අපක්ෂපාතීව කටයුතු කිරීම සහ තම පෞද්ගලික මතය සමීක්ෂණ ක්‍රියාවලියට ඇතුළුවීමට ඉඩ නොහැරීම
* දත්ත සුරක්ෂිතව ගබඩා කිරීම

ලකුණු 4 x 3 = 12

| | |
|---|---|
| **(iv)** | **ශ්‍රී ලංකාව තුළ මාධ්‍ය නියාමනයේ අවශ්‍යතාව පහත කරුණු යටතේ උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න.** |

(අ) මහජන සාමය ආරක්ෂා කිරීම

* ජාතිකත්වය, වාර්ගිකත්වය සහ ආගමික වශයෙන් සමානාත්මතාවය බිඳ වැටෙන සන්දේශ නියාමනය කිරීම
  උදා: ජන වර්ග අතර කැලඹීමක් ඇති වන ආකාරයට පුවෘත්ති වාර්තා කිරීම
* ගැටුම්කාරී පරිසරයක් ඇතිවීම නියාමනය කිරීම
  උදා: දේශපාලන මැතිවරණ අවස්ථා
* දිවි නසාගැනීම් හා දරුණු අපරාධ වැනි දේ සවිස්තරාත්මකව ප්‍රචාරණය කිරීමේ දී නියාමන සිදු කිරීම
* භාව ප්‍රකෝපවන ආකාරයේ සන්දේශ නියාමනය කිරීම
  උදා: පවුල් ආරවුල්, උද්ඝෝෂණ, තරුණ කණ්ඩායම් අතර ගැටුම්

(ආ) තනි පුද්ගල අයිතීන්ට සිදු වන බලපෑම පාලනය කිරීම

* පුද්ගල ප්‍රතිරූපය බිඳවැටෙන පරිදි ප්‍රචාරය කරනු ලබන ව්‍යාජ තොරතුරු නියාමනය කිරීම.
* ක්‍රීඩකයින්, කලාකරුවන්, දේශපාලඥයින්, වෛද්‍යවරු ආදී විවිධ ක්ෂේත්‍රවල නියැළුණු පුද්ගලයින්ගේ ආත්ම අභිමානය හෑල්ලුවට ලක්කිරීම නියාමනය කිරීම.
* ස්ත්‍රී දූෂණ, අපරාධ සම්බන්ධ පුද්ගලයින්ගේ නම්, ගම් ප්‍රසිද්ධ කිරීම මගින් පෞද්ගලිකත්වයට හානි වන තොරතුරු නියාමනය කිරීම.
* ප්‍රසිද්ධ චරිතවල ඥාතීත්වය පදනම් කරගෙන සිදු කරන අපහාස කිරීම් නියාමනය කිරීම.
* වෛවාහික කරුණු පිළිබඳ වාර්තා කිරීමේ දී සැලකිලිමත්වීම.

| | |
|---|---|
| විස්තර කිරීම ලකුණු | 6 x 2 = 12 |
| උදාහරණ දැක්වීම ලකුණු | 2 x 2 = 4 |
| මුළු ලකුණු | = 16 |

**6. මානව සන්නිවේදන ක්‍රියාවලිය කාලානුරූපීව නවීකරණය වෙයි.**
**(i) සම්ප්‍රදායික මාධ්‍යවල ලක්ෂණ දෙකක් ලියන්න.**

* සරල ව්‍යුහය
* තේමාත්මක අන්තර්ගතය
* නම්‍යශීලීත්වය
* සංස්කෘතික සන්දර්භය
* අවම පිරිවැය
* පරිසරයෙන් සපයා ගත හැකි සම්පත් යොදා ගැනීම
* විශ්වාස හා ගරුකිරීම
* පොදු පිළිගැනීම හා පොදු යහපත
* පාරම්පරිකව උරුමවීම
* දේශීය සංස්කෘතික අනන්‍යතාව
* භාවිතය පහසුවීම
* නියත කර්තෘත්වයක් නොමැතිවීම
* ජන මූල පදනම

(ලකුණු 2 x 2 = 4)

**(ii) සන්නිවේදනය සඳහා භාවිත සමාජ මාධ්‍ය යෙදවුම් දෙකක ක්‍රියාකාරිත්වය කෙටියෙන් විස්තර කරන්න.**

- **ෆේස්බුක් (Facebook)**
  * අනන්‍යයන් සමග සබඳතා ගොඩනගා ගත හැකිවීම
  * සජීවී විස්තර ප්‍රචාරය කළ හැකිවීම
  * ඡායාරූප හා වීඩියෝ සමාජ මාධ්‍ය ජාලයට එක් කළ හැකිවීම
  * ආයතන, පුද්ගල ප්‍රවර්ධනය සිදුකළ හැකිවීම
- **වට්ස්ඇප් (Whatsapp)**
  * මාර්ගගත ශ්‍රව්‍ය හා ශ්‍රව්‍ය දෘශ්‍ය ඇමතුම් ලබාගැනීම
  * කෙටි පණිවිඩ, හඬ, ඡායාරූප හා වීඩියෝ බෙදා හැරීමේ හැකියාව
  * විවිධ අරමුණු සඳහා කණ්ඩායම් නිර්මාණය කර ගෙන සන්නිවේදනය කිරීම
  * මාර්ගගත අධ්‍යාපනය සඳහා යොදා ගැනීම
- **ට්විටර් (Twitter)**
  * කෙටි පණිවිඩ හුවමාරු කළ හැකිවීම
  * පුද්ගල හා ආයතනික නිල ගිණුම් මගින් පණිවිඩ නිකුත් කිරීම
- **ලින්ක්ඩ්ඉන් (Linkedin)**
  * වෘත්තීය මට්ටමින් ක්‍රියාත්මක ජාලයකි.
  * වෘත්තීය හා ව්‍යාපාරික ප්‍රජාව අතර ප්‍රචලිත සමාජ ජාලයකි.
- **පින්ටරෙස්ට් (pinterest)**
  * ඡායාරූප වර්ගීකරණය හා බෙදාහැරීම සඳහා වන ජාලයකි.
  * ඡායාරූපය ඔස්සේ ඒ පිළිබඳ වැඩි විස්තර වෙත ප්‍රවේශ වීමට හැකිවීම
- **ඉන්ස්ටග්‍රෑම් (Instagram)**
  * ඡායාරූප හා වීඩියෝ බෙදා හැරීමේ සමාජ මාධ්‍යයකි.
  * Facebook, Twitter වැනි සමාජ ජාලා වෙත මේ ඔස්සේ ඡායාරූප යොමු කළ හැකිය.
- **ස්කයිප් (Skype)**
  * වීඩියෝ, හඬ සහිතව ඇමතුම් මගින් කණ්ඩායම් සම්මන්ත්‍රණ සිදු කළ හැකිවීම
- **වයිබර් (Viber)**
  * කෙටි පණිවිඩ, හඬ, ඡායාරූප හා වීඩියෝ බෙදා හැරීමේ හැකියාව පවතී.
  * පරිශීලකයන් නොවන අය සමග ද සන්නිවේදනය කළ හැකිය.

(ලකුණු 4 x 2 = 8)

**(iii) මාධ්‍ය අන්තර්ගතය නිර්මාණය කිරීමේ දී කෘත්‍රිම බුද්ධිය (Artificial Intelligence) යොදා ගත හැකි ආකාරය පහත අවස්ථාවලට විශේෂිතව විස්තර කරන්න.**

**(අ) ගීත නිර්මාණකරණය**

- අපට අවශ්‍ය තේමාවට හා රස භාවයට අදාළව සුදුසු භාෂාවෙන් AI තාක්‍ෂණය ඔස්සේ ගීතය රචනා කිරීම
  උදා: තේමාවට - ජන සංස්කෘතියට, බටහිර සංස්කෘතියට
  රසභාවයට - ආදරය, විරහව, කරුණාව, භක්තිය
- තෝරා ගත් ගායකයෙකුගේ හෝ ගායිකාවකගේ කටහඬ ලබා දුන් පසු මෙම තාක්‍ෂණයෙන් ගීතය ගායනා කිරීම
- පරිගණක වැඩසටහන්, මෘදුකාංග භාවිතයෙන් සංගීත සංරචනාව AI තාක්‍ෂණයෙන් නිර්මාණය කරයි.
- ගීතයට අදාළ රූප රචනයක් නම් AI තාක්‍ෂණයෙන් උපදෙස් ලබා දී අවශ්‍ය පරිදි සිදුකිරීම
- වයෝවෘද්ධ හෝ මියගිය ගායකයෙකුගේ රූපය, කටහඬ ඔහුගේ තරුණ කාලයට අනුරූපව AI තාක්‍ෂණය මගින් නිර්මාණය කළ හැකිවීම

**(ආ) රූපවාහිනී වැඩසටහන් ඉදිරිපත් කිරීම**

- AI තාක්‍ෂණය මගින් රූපවාහිනී වැඩසටහනට අදාළ තේමාව ඔස්සේ තිර පිටපත රචනා කිරීම
- එම වැඩසටහනට අවශ්‍ය පසුතලය නිර්මාණයද AI තාක්‍ෂණයෙන් සකස් කිරීම
- වැඩසටහනට ගැළපෙන නිවේදක නිවේදිකාවන්ගේ රූපය, කටහඬ AI තාක්‍ෂණයෙන් භාවිත කිරීම
- මේ සියල්ල මානව එළඹුමකින් තොරව ස්වයංක්‍රීයව සිදු කරයි
- නිශ්චල ඡායාරූප, සජීවී අංග චලන සහිතව යොදා ගැනීමට හැකිවීම
- වැඩසටහන ඉදිරිපත් කිරීමේ දී නිවේදක, නිවේදිකාවන්ගේ අංග චලන, අභිනයන් AI තාක්‍ෂණය මගින් වෙනස් කළ හැකිවීම

ලකුණු 6 x 2 = 12

**(iv) නිර්මහාපරිමාණකරණයේ ලක්‍ෂණ පහත මාධ්‍යවලට විශේෂිතව නිදසුන් දක්වමින් පහදන්න.**

**(අ) මුද්‍රිත මාධ්‍ය**

- ග්‍රාහක ක්ෂේත්‍රය කුඩා කණ්ඩායම්වලට බෙදීම නිර්මහාපරිමාණකරයෙන් සිදු වේ. එහිදී පාඨකයාගේ වෘත්තිය, වයස, ස්ත්‍රී පුරුෂභාවය, අධ්‍යාපන මට්ටම ආදී වර්ගීකරණය ඔස්සේ මුද්‍රිත මාධ්‍ය සන්දේශ පළවේ
  උදා: පුවත්පත්, සඟරා විවිධ විෂය ක්ෂේත්‍ර අනුව ක්‍රීඩා/ අධ්‍යාපනික/ කාන්තා/ ආගමික/ ජ්‍යෝතිෂ ආදී වශයෙන් වෙන් වෙන්ව නිකුත් කිරීම
- ජාතික පුවත්පත් සමග විවිධ විෂයයන් අනුව ටැබ්ලොයිඩ් ප්‍රමාණයේ පුවත් අතිරේක ලබා දීම
- නිශ්චිත ඉලක්ක ගත කණ්ඩායමකට සන්නිවේදනය කිරීම
  දේශපාලනික/ අධ්‍යාපනික/ සෞඛ්‍ය/ කෘෂිකර්ම ආදී ක්ෂේත්‍රවල සිටින පුරවැසියන් දැනුවත්වීමට අත්පත්‍රිකා, පෝස්ටර්, බැනර් ආදිය යොදා ගැනීම
- ග්‍රාහකයින්ට ප්‍රාදේශීයව තොරතුරු ලබාදීම
  උදා: Kandy / ගම්පහ / උදයන් පුවත්පත්
- ඉලක්කගත මාධ්‍ය පණිවිඩයක් තෝරා ගත් ග්‍රාහක කණ්ඩායමක් වෙත යැවීම
  උදා: ඩෙංගු, මී උණ වැනි වසංගත රෝග ව්‍යාප්ත කාලයේ දී අවදානම සහිත ප්‍රදේශවල පුරවැසියන් අත්පත්‍රිකා මගින් දැනුවත් කිරීම

(ආ) සමාජ මාධ්‍ය

- ග්‍රාහක ක්ෂේත්‍රය කුඩා කණ්ඩායම්වලට බෙදීම
  උදා: ව්‍යාපාරික, අධ්‍යාපනික, දේශපාලනික, වෘත්තීමය, සේවා ස්ථාන අනුව, ප්‍රජා සංවිධාන අනුව සමාජ මාධ්‍ය තුළ කණ්ඩායම් ගොඩනගා ගැනීම (Facebook, Whatsapp)
- නිශ්චිත ඉලක්කගත කණ්ඩායමකට සන්නිවේදනය කිරීම
  උදා: අධ්‍යාපනය - විෂයයන් අනුව කණ්ඩායම් සමාජ මාධ්‍ය ගොඩනගාගෙන විෂය කරුණු, ප්‍රශ්න පත්‍ර ආදිය හුවමාරු කර ගැනීම
- මාතෘකා කිහිපයක් තෝරා ගෙන සන්නිවේදනය කිරීම
  උදා:

  Youtube නාලිකාවල ඉවුම් පිහුම්, වෛද්‍ය සාකච්ඡා, රූපලාවන්‍ය, අධ්‍යාපනික, ධර්මදේශනා, කාටූන්, ළමා ගීත, සංචාරක, නැරඹුම් ස්ථාන ආදිය දැකගත හැකිය.

  Facebook page (පිටු) ව්‍යාපාරික අවස්ථා, භාණ්ඩ හා සේවා සැපයීම, නිෂ්පාදන, දේශපාලන, කාන්තා, පුද්ගල ප්‍රතිරූප, පාරිසරික, සංස්කෘතික, කලා, ක්‍රීඩා ආදී පිටු දැක ගත හැක.

- ඉලක්කගත සන්දේශයක් තෝරාගත් ග්‍රාහක කණ්ඩායමක් වෙත යැවීම
  උදා:Whatsapp Group, Instagram, Facebook ආදී සමාජ මාධ්‍ය හරහා ඉලක්කගත සන්දේශයන් තෝරාගත් ග්‍රාහකයන් සමග හුවමාරු කර ගැනීම
  පාසලක අදාළ ශ්‍රේණියට, විෂයන් අනුව ශිෂ්‍යයින් සමාජ මාධ්‍යය තුළ කණ්ඩායම් කර ඒ අතර පණිවිඩ හුවමාරු කිරීම.
- Algorithm
  අප වරක් සන්දේශය තෝරා ගත් විට ස්වයංක්‍රියව නැවත ඊට අදාළ සන්දේශ ගණනාවක් තිරය තුළ දිස්වීම

(සම්පූර්ණ ලකුණු ලබාදීමට නිදසුන් ඇසුරෙන් පැහැදිලි කළ යුතුය.)

| | |
|---|---|
| විස්තර කිරීම ලකුණු | 6 x 2 = 12 |
| උදාහරණ දැක්වීම ලකුණු | 2 x 2 = 4 |
| මුළු ලකුණු | = 16 |

**7. මාධ්‍ය සාක්ෂරතාව හා මාධ්‍ය විචාරය අතර සමීප සම්බන්ධතාවක් පවතී.**
**(i) සාක්ෂරතාව යනු කුමක් ද?**

ලිවීමට හා කියවීමට ඇති හැකියාව

ලකුණු = 4

**(ii) ඥාන ව්‍යුහ ගොඩනගා ගැනීමට තොරතුරු ඉවහල්වන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.**

- සැලැස්මකට අනුව තොරතුරු තෝරා බේරා ගැනීම
- පුද්ගල අත්දැකීම්, රුචි අරුචිකම්, කුසලතා ආදිය තොරතුරු තෝරාගැනීමට හේතුවීම
- තොරතුරු යම් රටාවකට ගොඩනැගීම
- උචිත, ගැඹුරු, ඵලදායී තොරතුරු තුළින් ඥාන ව්‍යුහ වැඩිදියුණු කර ගත හැකිය.
- අනුචිත, නොගැඹුරු, නිශ්ඵල තොරතුරු බැහැර කිරීම
- තමා සතු කුසලතා භාවිතයට ගෙන තොරතුරු තෝරාගැනීම

ලකුණු 4 x 2 = 8

**(iii) මාධ්‍ය හා සම්බන්ධ ස්ත්‍රීවාදී විචාරයෙහි ඔබ හඳුනා ගන්නා ප්‍රධාන ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න.**

- ස්ත්‍රී අයිතිවාසිකම් පිළිබඳව ලිංගිකත්ව සමානාත්මතා පදනමක සිට විචාරය කිරීම
- මාධ්‍ය සන්දේශ තුළ කාන්තාවට එරෙහි වෙනස්කම් සිදුකිරීම/අවප්‍රමාණය කරන ආකාරය නිරීක්ෂණය කිරීම
- ස්ත්‍රීන් හා ස්ත්‍රීත්වය පිළිබඳ වටිනාකම් බෙදාහැරීම උදෙසා මාධ්‍ය දායක විය යුතු බව
- ස්ත්‍රීන්ගේ වටිනා බොහෝ පැති මාධ්‍ය මගින් නොසලකා හැරීම
- මාධ්‍ය ආධිපත්‍ය පුරුෂයන් සතුව පවත්නා බව හඳුනා ගැනීම
- මාධ්‍ය තුළ ස්ත්‍රිය ඒකාකෘතික ලෙස නිරූපණය කිරීම
- කාන්තාව ලිංගික භාණ්ඩයක් ලෙස නිරූපණය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම.

ලකුණු 4 x 3 = 12

(iv) මාධ්‍ය සන්දේශ විශ්ලේෂණය කිරීම සඳහා පහත අංග යොදා ගන්නා ආකාරය උදාහරණ ඇසුරෙන් විමසන්න.

(අ) අදාළ බව

- අපේක්ෂිත අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා සන්දර්භයේ අවශ්‍යතාවයන්ට ගැළපෙන ලෙස සන්දේශ ඉදිරිපත් කිරීම
- සන්දේශයට අදාළ අන්තර්ගතය, ආඛ්‍යානය, අනුක්‍රමය, සම්බරතාව, සුසංයෝගය ප්‍රමාණාත්මක බව, උචිත තාක්ෂණික භාවිතය, මනා ලෙස ගළපා ඇති ආකාරය හඳුනාගැනීම
- අදාළ බව, පුද්ගල රුචි අරුචිකම් මත තීරණය වුවද වඩා වැදගත් වන්නේ මනා අවබෝධයෙන් යුතුව අදාළ බව තීරණය කිරීමයි.

(ආ) පෙළඹවීම/ අභිප්‍රේරණය

- මාධ්‍ය පෙළඹවීම මගින් පුද්ගලයා සිය ආකල්ප හා චර්යා වෙනස් කරගන්නා ආකාරය හඳුනාගැනීම.
- මාධ්‍ය මගින් පුද්ගල විශ්වාස, ආකල්ප, අභිප්‍රාය හෝ හැසිරීම කෙරහි බලපෑම් ඇතිකර පිළිගැනීමට යටත් කිරීම.
- ආකල්ප වෙනස් කිරීම, හැසිරීම් වෙනස් කිරීම, කාලයත් සමග වෙනස් කිරීම යනාදී මානයන් සඳහා පෙළඹවිය හැකිවීම.

(ඉ) විශ්වසනීයත්වය

- සන්දේශය ග්‍රාහකයා තුළ පිළිගැනීමට ලක්වන්නේ කෙසේදැයි හඳුනාගැනීම. සන්නිවේදකයා නව විශ්වාසයක් ලබා දුන්නද ලබන්නා විශ්වාස නොකරන්නේ නම් එය ප්‍රතික්ෂේප වීම.
- බහුමානීය ලෙස විශ්වසනීයත්වය හට ගැනීම සිදුවන අතර විවිධ මානයන්ට අනුව විශ්වාසය ගොඩනැගේ.
- විශ්වසනීයත්වය තක්සේරු කිරීමට සරල රීතියක් නොමැති නමුත් ඒ සඳහා විනිශ්චය වැදගත් වේ.

(ඊ) විකෘතිකරණය

- සන්දේශයක අන්තර්ගතය වෙනස් කොට ඉදිරිපත් කිරීම
- එක් පාර්ශ්වයක් විසින් වෙනත් පාර්ශ්වයකට ගෙන යනු ලබන නාලිකා හෝ විවිධාකාරයේ මැදිහත්වීම් වලින් සන්දේශ විකෘති කිරීමකට ලක්වේ.
- අතිශයෝක්තියට නැගීම, නින්දා කිරීම, අනුවර්ති වක්‍රෝක්තිකරණය, ප්‍රත්‍යක්ෂණය, පාර්ශ්වීය බව, විස්තර විශාල කිරීම, පර්යාලෝක ආදිය මගින් විකෘතිකරණය ඇතිවේ.

| | |
|---|---|
| විස්තර කිරීම ලකුණු | 3 x 4 = 12 |
| උදාහරණ දැක්වීම ලකුණු | 1 x 4 = 4 |
| මුළු ලකුණු | = 16 |